# "පෙමතො ජායති සෝකො" යන නාට්‍යය නිර්මාණය කිරීමේදී මූලාශ්‍රයන්ට අමතරව සිදුකොට ඇති වෙනස්කම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක්

**අලහේනේගම සුමනරතන හිමි**

## හැඳින්වීම

ක්‍රි. පූ. හයවන සියවසටත් පෙර ලෝකයේ නාට්‍ය කලාවක් පැවති බවට යම් යම් තොරතුරුවලින් අනාවරණය වෙයි. වාර්තා වෙන විස්තර අනුව ප්‍රථමයෙන් ලෝක නාට්‍ය කලාවක් නිර්මාණය වූයේ ග්‍රීසියේ බැව් පෙනේ. එයින් පසුව ඉන්දියාව වැනි පෙරදිග රටවල නාට්‍යය බිහිවන්නට ඇතැයි විශ්වාස කෙරේ. ක්‍රි. පූර්ව ගණන්වල ග්‍රීසියේ මෙන්ම පසු කාලයේ සිටම ඉන්දියාව, චීනය, එංගලන්තය, ජපානය ආදි රටවල ද නාට්‍ය කලාව ක්‍රමවත් වන්නට විය. ආරම්භයේ සිට ප්‍රකට ඉතිහාසයේ සාහිත්‍ය යන අංශයට මුල්තැනක් ලැබුණත් නාට්‍ය යන අංශයට හෙවත් දෘශ්‍ය කාව්‍ය ගණයට එතරම් වැදගත් ස්ථානයක් හිමි නොවීය. එහෙත් පසු කාලය වනවිට ලෝක නාට්‍ය කලාවේ බැබළීමක් ඇති වන්නට විය. එයින් පසුව එංගලන්තය ආදී අපරදිග රටවලත් ඉන්දියාව, ජපානය, චීනය වැනි පෙරදිග රටවලත් නාට්‍ය අංශය ප්‍රකට වන්නට විය. ක්‍රි. පූ. දෙවෙනි ශතවර්ෂයේ භාරතයේ වාසය කළ භරතමුනි පඬිවරයා ස්වකීය නාට්‍ය ශාස්ත්‍රයේ නාට්‍ය වර්ග දෙකක් ඇති බැව් සඳහන් කරයි. ඒ ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී වශයෙනි.[1]

ලෝක ධර්මතා තාත්වික ආකාරයටකට විදහා පෙන්වන නාට්‍ය වර්ග ලෝක ධර්මී නම් වේ. කිසියම් ශෛලියකට අනුව

රඟ දක්වන නාට්‍ය වර්ග නාට්‍ය ධර්මී හෙවත් ශෛලිගත නාට්‍ය වර්ගයට අයත් වේ.[2]

## නාට්‍ය යනු කුමක්ද?

නාට්‍ය යන්න නිර්වචනය කිරීමේ දී භරතමුනි නම් රචකයා විසින් ද අදහස් දක්වනු ලැබීය. ලෝකයේ පැවැත්ම අනුකරණය කිරීම නාට්‍ය නම් වන බව ඔහු පවසයි. (ලොක වෘත්තානුකරණං නාට්‍යම්)[3] හිරිපිටියේ පඤ්ඤාකිත්ති ස්වාමීන්ද්‍රයෝද "භාරතීය රංගන කලාව හා භරතමුනි යන ග්‍රන්ථයේ" පාත්‍රයා තම ස්වභාවය අතහැර වෙනත් ස්වභාවයක් ගනු ලබයි නම් එය නාට්‍ය නම් වේ. හෙවත් රූප නම් වේ. යන අභිනව ගුප්තගේ ප්‍රකාශය සඳහන් කරති.[4] නානා භාවයන්ගෙන් අනූන වූ ද, නානා අවස්ථාවන් ගබ්වූ ද, ලෝකයාගේ පැවැත්ම අනුකරණය කරන්නේද, එය නාට්‍ය නම් වේ.[5] බටහිර විචාරකයෙකු වූ කොල්රිජ් නමැත්තා "නාට්‍ය යනු ස්වභාවිකත්වයේ පිටපතක් නොව අනුකරණයක් පමණි" යනුවෙන් ප්‍රකාශ කරයි.[6] ග්‍රීසියේ දාර්ශනිකයෙකු වූ ඇරිස්ටෝටල් නමැත්තා "නාට්‍ය යනු කිසියම් ක්‍රියාවක් අනුකරණය කොට දැක්වීම බව සඳහන් කරයි.[7]

## සිංහල නාට්‍ය කලාවේ ආරම්භය

ලෝක නාට්‍යකලාව සංවර්ධනය වූවා සේ සිංහල නාට්‍ය කලාව ද ක්‍රි. ව. 17-18 වැනි ශතවර්ෂවලදී දියුණු වන්නය විය. එහිදී සොකරි, කෝලම්, නාඩගම් ආදී නාට්‍ය වර්ගවලිනුත් නූර්ති, මිනර්වාක් වැනි නාට්‍ය විශේෂය තුළිනුත් සිංහල නාට්‍ය ක්‍රම ඉදිරියට ගලා ආයේය. බොහෝ දුරට ආගමික ඇදහිලි විශ්වාස ද මුල් කරගනිමින් වරින්වර විදේශීය ආභාසයද හමුවේ සිංහල නාට්‍යාංග විකාශය වන්නට පටන් ගත්තේය. එක්දහස් නවසිය හතළිස් ගණන්වලින් පසුව නාට්‍ය ධර්මී හෙවත් ශෛලිගත නාට්‍ය සම්ප්‍රදායත්, ලෝකධර්මී නාට්‍ය සම්ප්‍රදායත් ඇතුළත් සිංහල නාට්‍ය ක්‍රම දියුණු විය. සිංහල නාට්‍ය කලාවේ වර්තමාන පුරෝගාමියා ලෙසින් මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර යන නාමය සැලකෙයි. මෙතුමා ප්‍රෞඪ ඉතිහායක් ඇති පේරාදෙණිය වැනි



විශ්වවිද්‍යාලවල මහාචාර්යවරයෙකි. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙකි. කීර්තිමත් කලාකරුවෙකි. උසස් ප්‍රාඥයෙකි. උසස් සමාජ සෝධකයෙකි. විදේශයේ ද සේවය කළ මාහැඟි රාජ්‍ය තාන්ත්‍රිකයෙකි. ක්‍රි. ව. 1914 ජුනි මස 03 වෙනි දින දකුණු පළාතේ රත්ගම, නියාගමදී උපන් මෙතුමා පානදුර කොළඹ ආදී ප්‍රදේශවල අධ්‍යාපනය හදාරා 1924 වසරේදී කොළඹ යුනිවර්සිටි කොලීජියෙන් පාලි, සංස්කෘත සිංහල වැනි විෂයයන් උගෙන ගුරුවරයෙකු වශයෙන් මුල් පත්වීම ලබා පසුව කොළඹ සේවය කෙළේය. අනතුරුව ඉන්දියාව, එංගලන්තය ආදී රටවලින් අධ්‍යාපනය හදාරා කලා අංශයෙන් Ph.D. උපාධිය ද දිනා ගත්තේය. රසිකයන් හා සාමාන්‍යයෙන් ජනයාගේ හදවත් අතර ජීවත් වූ මෙතුමා 1996 වසරේදී අභාවප්‍රාප්ත විය.[8]

## සිංහල නාට්‍ය කලාවේ පුරෝගාමියා

විවිධ පර්යේෂණවල නියැලුණු මෙතුමා නාට්‍ය, නවකථා, කෙටිකථා ආදී උසස් කෘතීන් නිර්මාණය කරමින් උසස් ලේඛකයෙකු බවට ද පත්විය. මොහුගේ නවකථා අතර මළගිය ඇත්තෝ, මළවුන්ගේ අවුරුදු දා, නුදුටිමි, විලාසිනියකගේ ප්‍රේමය වැනි නිර්මාණ වෙයි. කෙටිකථා අතර රූපසුන්දරී, කාලයාගේ ඇවෑමෙන්, මායාරූපය වැනි කෘති වෙයි. ඔහු නිර්මාණය කොට ඇති සිංහල නාට්‍ය ප්‍රමාණය ඊට වඩා වැඩිය. එසේම සෑම නාට්‍යයක් ම පාහේ ජනයා අතර ප්‍රසිද්ධියට ද පත්විය. එම නාට්‍යයන් අතර, මනමේ, සිංහබාහු, ලෝමහංස, වෙස්සන්තර, මහාසාර, බව කඩතුරාව, බහිනකලාව, තරුණ ලේඛකයා, වදින්න ගිය දේවාලෙ, වළ ඉහගෙන කෑම, රත්තරන්, පබාවතී, කදාවළලු, හස්තිකාන්තමන්තරේ, පෙමතො ජායතී සොකො වැනි නාට්‍යයන් ප්‍රචාරයට පත් වූ අතර මනමේ සිංහබාහු වැනි නාට්‍ය අදත් ප්‍රේක්ෂකාගාරවල ජනප්‍රියව වේදිකා ගත වෙයි.

## පෙමතො ජායතී සොකො නාට්‍යය

මෙම නාට්‍ය සරත්චන්ද්‍රයන් අතින් නිර්මාණයට පත් වූයේ 1959 වර්ෂයේදීය. ගීත නාටකයක ආකාරයෙන් රචනා විය. මෙහි

63181

අන්තර්ගත සංගීතය නිර්මාණය වූයේ සංගීතඥ ජී. ඩබ්ලිව්. ජයමාන්න මහතා අතිනි. පසුව මෙම නාට්‍යය ඉංග්‍රීසි භාෂාවට ද පරිවර්තනය විය. පෙමතො ජායතී සොකො යන නාට්‍යය නිර්මාණය වීමේදී එදිරිවීර සරත්චන්ද්‍රයෝ මූලාශ්‍ර කෘතීන් කීපයක්ම ආශ්‍රය කළහ. එයින් පාලි රසවාහිනී ග්‍රන්ථය, සිංහල සද්ධර්මාලංකාරය, පාලි ධම්මපදය යන ග්‍රන්ථ ප්‍රධානස්ථානය හිමිකර ගනියි. පාලි රසවාහිනී හා සිංහල සද්ධර්මාලංකාරය යන කෘති දෙකෙන් පළමුවෙන් ම රචනා වී ඇත්තේ රසවාහිනී නම් ග්‍රන්ථයයි. පාලි රසවාහිනී ග්‍රන්ථය දඹදෙණි රාජ්‍ය කාලයේ පතිරාජ පරිවේණාධිපතිව වැඩ විසූ වේදේහ නම් හිමියන් විසින් රචනා කරන ලද්දකි. මෙහි එන කථා 103 කි. එයින් ජම්බුද්දීපුප්පත්ති කථා 40 කි. අනෙක් කථාවස්තු 63 ලංකාදීපුප්පත්ති කථාවන්ය. මෙයින් සරත්චන්ද්‍රයන් ගේ "පෙමතො ජායතී සොකො" නාට්‍යයට මුල් වී ඇත්තේ දඹදිව නිර්මාණය වූ කථා හතළිහෙන් සුවණ්ණතිලකාය වත්ථු නමින් හැඳින්වෙන කථාවස්තුවයි.[9] පාලි රසවාහිනියට අමතරව සරත්චන්ද්‍ර මහතා අනුගමනය කොට ඇත්තේ "සද්ධර්මාලංකාර" නම් ග්‍රන්ථයයි. මෙම කෘතිය රචනා කොට ඇත්තේ ගම්පොළ රාජධානි සමයේ ගඩලාදෙණි ප්‍රදේශයේ වැඩ විසූ දේවරක්ෂිත විජයබාහු ධර්මකීර්ති නම් හිමි නමකි.[10] මෙම ග්‍රන්ථය බොහෝ දුරට රසවාහිනීයේ පරිවර්තනයක ලක්ෂණ පෙන්නුම් කරයි. සද්ධර්මාලංකාරයේ දී රසවාහිනියේ සඳහන් පාලි ගාථා එලෙසින්ම දක්වා ඇති බැව් පෙනේ. එය සරල සුගම කථා ප්‍රවෘත්තියකි.

## සද්ධර්මාලංකාරයේ දැක්වෙන කථාවස්තුව සංක්ෂේප වශයෙන් මෙසේය

ලක්දිව අනුරාධපුරයේ එක්තරා සැදැහැවත් මවක් නිතරම මල්කඩා ගෙනවුත් අභයගිරි චෛත්‍යරාජයාට පූජා කරන්නීය. දිනක් තම බාල දුව සමග අභයගිරියට ගිය ඇය මලසුන් ගෙයි පැන් නොදැක මල්කුඩය තම දුවට දී පැන් සෙවීමට කළය ගෙන අසල ඇති පොකුණට ගියාය. මවගේ පැමිණීම ප්‍රමාද නිසා දුව



25 MAY 2022

මල්මිටක් ගෙන මණ්ඩලාකාරව මලින් රවුමක් සඳා විසිතුරු ලෙස බුදුරදුන්ට පූජා කොට එහි අනුහසින් උපනුපන් ආත්මභාවයන්හි ආරෝහ පරිණාහ දේහ සම්පතින් යුතුව, යහපත් රූසපුවෙන් යුතුව පැහැදිලි අහසෙහි දිස්වෙන සූර්ය මණ්ඩලය සෙයින් තේජස්ව පුරුෂයන් කාමමූර්ජාවට පත්වෙන කටහඬින් යුක්ත වෙම්වායි ද පැතුවාය. මේ පිළිබඳව රසවාහිනියේ මෙසේ දැක්වෙයි.

"මංදිස්වා පුරිසාසබ්බෙ - මුය්හන්තු කාම මුච්ඡිතා
නිච්ඡරන්තු සරීරාමෙ - රංසිමාලීව රංසියෝ.[11]

අනතුරුව එතැනට පැමිණි දුවගේ මාතාව ආසනය පිරිසිදු නොකොට මල් පිදූ බව දැනගෙන "එම්බල චණ්ඩාල කෙල්ල! අත්‍යන්ත නිර්මල වූ බුදුරජාණන් වහන්සේට මලස්න නොසෝධා කුමක් පිණිස මල් පිදීද? තී කෙළේ කටයුත්තක් නොවේ' යි කීවාය."

ඒ ඇසූ දූ කුමරිය මවට කුපිත වී චණ්ඩාල කෙල්ල නම් ඔබම යයි බැණ වැදුණාය. ඒ අත් බවින් පසුව කුමරිය දඹදිව උත්තර මධුරා නම් නුවර වීණා ගායනා කරන චණ්ඩාල බමුණෙකුගේ දුවක්ව උපන්නාය. කලින් ආත්ම භාවයේ කළ ප්‍රාර්ථනාව නිසා විදුලි කළඹක් වැනි රශ්මිමාලා ඇගේ සිරුරින් නික්මිණ. සතර රියනක් වටේට බැබළිණ. මුඛයෙන් මානෙල් මල් සුවඳ හැමීය. සිරුරින් සඳුන් සුවඳ නික්මිණ. දෙතන මැද රන්වන් තිලකාභරණයක් මැවිණි. ඇව දුටු දුටු පුරුෂයෝ කාමයෙන් මත් වූහ. ගිය ආත්මයේදී මවට චණ්ඩාලිය ඔබයයි බිණූ නිසා ඒ අකුසල බලයෙන් මේ අත් බැව්හිදී හීන ජාතියක චණ්ඩාල කෙල්ලක්ව උපන්නාය. ගිය ආත්මයේ සෑ රදුන්ට මල් පිදූ බලයෙන් මේ අත් බැව්හිද මනෝඥ වූ සුවඳවත් වූ ප්‍රියංකර රූසපුවෙන් යුක්ත වූවාය. දෙමව්පියෝ මෙම පියකරු තැනැත්තියට ස්වර්ණතිලකා යන නම තැබූහ. දකින අයගේ සිත් වශීකරන සුවඳවත් වූ ඇය තරුණ වියට පත්වීමෙන් පසුව එම උත්තරමධුරා නුවර පොහොසත් බොහෝ ජනයෝ ආවාහ කරගැනීමට පැමිණියත් ඇය සැඩොල් කුලේ නිසා ආපසු ගියහ.

63161

අනතුරුව එම නුවර ප්‍රධාන චණ්ඩාල බ්‍රාහ්මණගේ පුත්‍රයෙක් නොයෙක් වස්තුව ගෙනගොස් ඇයව සරණ කර ගැනීමට ඉල්ලා සිටියේය. එම යෝජනාවද ඇය ප්‍රතික්ෂේප කළාය. ලජ්ජාවට පත් සැඩොල් පුත්‍රයා එරට රජතුමා ඉදිරියට ගොස් මෙසේ කීවේය.

''රජ්ජුරුවන් වහන්ස! ඔප් නැගූ කැඩපතක් මෙන් බබළන්නා වූ ස්ත්‍රීන්ගේ මුහුණ දැල බැඳුණු මසුන් මෙන් චලිතව ලීලෝපේත වූ නේත්‍රයන් ඇත්තේද, තරුණ හිරු රැස් කළඹක් මෙන් අරුණවර්ණව ලෙල දී දිලිසෙන්නා වූ අධර යුග්මයක් ඇත්තේද, එබඳු රූපත් මනහර මුහුණු යම් පුරුෂයෙක් තමා සිය ඇසපුරා දැකපී නම් ඒතෙම එවැනි රූප සම්පත්තීන් යුක්ත ස්ත්‍රීන් හීන ජාතියෙහි උපන්නත් නොහරනේමය යි කීය.''

''ලලනානනානී චල ලොචනානි
තරුණාරුණානී චලිතාධරානී
මනුජෝහි යො නෙත්ත විසසං කරොති
සතු නීචජාති අපි නො ජහාතී''[12]

තම නුවර සිටින ස්වර්ණතිලකා සමාන කුලවන්තයෙකු නොපතා උසස් කුලයෙක පුරුෂයෙකු පතන බවත්, පහත් කපුටු ධේනුවක් කවර කලෙක ස්වර්ණ හංසරාජයෙකු සමග සංගමය වන්නේදැයි ද කියා සිටියේය. ඒ ඇසූ රජතුමා ස්වර්ණතිලකාගේ පියාගෙන් ඇසූ විට තම දියණිය උසස් කුලයෙක කෙනෙකු පතන බවද ඔහු සඳහන් කෙළේය. එවිට රජතුමා එසේ නම් පඤ්චමධුරා නුවර රජුට සේවය කරන උද්දාල නම් උසස් කුල බමුණෙකු ඇති බවත් ස්ත්‍රියක දුටුවොත් කිරි පැනින් මුව දොවා පිරිසිදු වී මාර්ගයේ කිරිපැන් ඉස රජගෙට පිවිසෙන බවත්, කැමති නම් ඔහු සමග ගිවිස ගන්නා ලෙසත් කීය. පිය බමුණා ද ඊට කැමතිව රජු කී පරිදිම දියණියට කීවේය. ස්වර්ණතිලකා ද ඊට කැමති වී පසුදා උදේම එහි යාමට කතිකා කර ගත්තාය.

පියා දහසක් වටිනා සළුවක්ද දියණියට පොරවා ඇ සමග වීණාවක් ද ගෙන පඤ්චමධුරාවට යන අතර මගදී වරින්වර ප්‍රාදේශිය රජවරු 5 දෙනෙකුටම වීණාව ගයා සළුව ඉවත් කොට ඇයව පෙනීමට සැලැස්වීය. අලංකාර, මනෝඥවූ ඇ දුටු ඔවුහු

63161



වශී වූහ. ඇයව කුලයෙන් පහත් වූ නිසා සරණ කර ගැනීමට අකමැතිව තම කඩුවලින් සියතින් ම ගෙල සිඳගෙන මරණයට පත්වූහ. සත්ත්වයෝ ක්ලේශ කාම හා වස්තුකාමය, තණ්හාව උපදවා ගෙන ශෝකයට පත් වී විනාශයට පත්වෙන බවත්, එයින් මිදී තෙරුවන් සරණින් විශුද්ධ වූ සත්ත්වයනට භය, ශෝක සන්ත්‍රාස ආදිය ඒකාන්තයෙන්ම සිදු නොවන බවත් බුදුරදුන් වදාරන ලද බව ධම්ම පදයේ සඳහන්

පියතො ජායති සොකො......
පෙමතො ජායති සොකො......
රතියා ජායති සොකො......
කාමතො ජායති සොකො......
තණ්හාය ජායති සොකො......

යනුවෙන් ගාථා පහක් මෙම අවස්ථාවට සම්බන්ධකර දක්වා ඇති අතර එයින් එක් ගාථාවක් සම්පූර්ණ වශයෙන් මෙසේය.

''තණ්හාය ජායතී සොකො - තණ්හාය ජායතී භයං
තණ්හාය විප්පමුත්තස්ස - නත්ථි සොකො කුතො භයං''[13]

අනතුරුව ක්‍රමයෙන් මග ගෙවා පියා හා ස්වර්ණතිලකා පඤ්චමධුරා පුරයේ රාජ සභාවට පිවිසියහ. රාජ සභාවේ භද්‍ර පීඨයක වාඩිවී සිටි උද්දාල බ්‍රාහ්මණයා දුටු ස්වර්ණතිලකා නිලුපුල් පෙති පරයන සුනිල් නෙතින් බලා කොඳ කැකුළු පරදන සුදු සිනිඳු දත්පෙළ හා අතිරක්ත අධර යුග්මය විහිදුවා සිනාසී ශරීර සෝභාව දක්වා ශරීරයෙන් රත් පලස පහල් කළාය. වෙනදා කතක දකින උද්දාල බමුණා කිරිපැනින් ස්නානය කොට මගට සොළොස් කළයක් කිරිපැන් ඉස පිරිසිදු වුවත් මේ අවස්ථාවේ ස්වර්ණතිලකාට වශීකෘත වී සුවඳින් හා ආශාවෙන් කුල්මත් වී සිහිසුන් විය. මද වේලාවකින් සිහිය ලැබූ උද්දාල වහා තම නිවසට ගොස් තම හිතවතුනට ස්වර්ණ තිලකාගේ මුඛ නමැති රත් පියුමට තමාගේ නේත්‍ර නැමති භෘංගයන් දෙදෙනා ඇලුම් කළ බවත් ඈව ගෙන්වා දෙන ලෙසත් අයැද සිටියේය. ඔහුගේ හිතවත්තු ඊට විරුද්ධ වී හීන කුලයක ස්ත්‍රියක් පාවා නොගන්නා

ලෙසට ද ආයාචනා කළහ. එසේ වුවහොත් කීර්තිය, ශරීර බලය, නුවණ ආදිය පිරිහී යන බවත් කීහ.

එම අවස්ථාවේ උද්දාල බමුණා කසළ ගොඩේ තිබුණත් මැණිකක් මහාර්ඝ බවත්, හීන කුලේ උපතත් පඤ්ච කල්‍යාණයෙන් යුතු ස්ත්‍රීරත්නය වටිනා බව කියා ස්වාමියකු සමග විවාහ වී නොමැති නම් ස්වර්ණතිලකා කැඳවාගෙන එන ලෙසට දැන්වීය. මිත්‍රයෝද ස්වර්ණ තිලකා සමීපයට ගොස් ඇයව රැගෙනවිත් උද්දාලට ඉදිරිපත් කළ විට ඇයව සරණපාවාගෙන මාස 4ක් පමණ රාජ්‍ය සේවයට පවා නොගොස් නිවසෙහි ඇ සමඟින්ම (අභිරමණය) කල් යැවීය.

උද්දාල ගුරුතුමාගෙන් ඉගෙනීමට පැමිණි පන්සියයක් පමණ ශිෂ්‍යයෝ සාරමසකින් පසුව ද ගුරුවරයා තමන්ට ශිල්ප ශාස්ත්‍රය ලබා දීමට නොපැමිණි බව දැනගෙන තවදුරටත් ස්වර්ණතිලකාව සිටියොත් විශාල විපතක් වන බව දැනගෙන තම ශිල්ප ශාස්ත්‍ර ඉගෙනුමට ද බාධා නිසා ඇ ජීවිතක්‍ෂයට පත්කරීමට කටයුතු යෙදූහ. ස්වර්ණතිලකා මැරවීමට ශිෂ්‍යයෝ තීරණය කරගෙන ඇතරුවෙකුට අල්ලස් දී ඔලමොළ ඇති ඇතෙකුට රා පොවා මත් කරවා ඇ මරවන ලෙස ඉල්ලා සිටියහ. ඇතරුවාද ඇතෙකුට රා පොවා මත් කරවා උද්දාලගේ නිවස ළඟට ගෙන ගියේය. ශිෂ්‍යයෝ එතැනට ගොස් ගුරුතුමා හමු වී පිළිසඳර කථා කොට දේවිය ද බලනු රිසි බව දැන්වූහ. උද්දාල ගුරුතුමා ද එය පිළිගත්තේය. වීථියට බට ස්වර්ණතිලකා දේවිය ළඟට රා බිම සොඬ පහරමින් සෙණයක්සේ පාත් වූ ඇත්රජ අවුත් කෝපාග්නිය අතහැර ඇයට ආදරය දක්වා සොඬින් තම හිස මත තබාගෙන ආදර ගෞරව දැක්වීය. අපේක්‍ෂා ඉටු නොවූ ශිෂ්‍යයෝ ඊට කෝප වී දෙවන දින රාත්‍රි මිනිසුන් පිරිසක් උද්දාලගේ නිවසට යවා ස්වර්ණතිලකාව මරාලූහ. එම අවස්ථාවේ උද්දාල බ්‍රාහ්මණ ගුරුතුමා සිත් තැවුලට පත්ව මෙබඳු ස්ත්‍රීරත්නයකින් වෙන්ව ජීවත්වෙනවාට වඩා මිය යාම වටින්නේයැයි සිතා අතිශය කණගාටුවට හා ශෝකයට පත්ව හඬමින් රාජාංගණයෙහි ම දරසෑයක් බඳවා ගිනිගෙන ඇති දරසෑයට පැන මිය ගියේය. එබැවින් ස්ත්‍රීන්ගේ වසඟයට පැමිණි



කාමී පුරුෂයෝ පරලොව විඳිනා අපාදුක් තබා මෙලොව්හි නොයෙක් අපාදුක්ව්‍යසන විඳ මරණයටත් පැමිණියාහුය.

ඒ අනුව ස්ත්‍රීහු නම් පුරුෂයන් වඤ්චා කරන හෙයින් මායා රූපයක් වැන්න. ඇදහිලි නොකොට හැකි හෙයින් මිරිඟු ජලයක් වැන්න. ශෝක, රෝග උපද්‍රව උපදවන ආකරයක් වැන්න. පුරුෂයන්ට තද වූ බන්ධනයක් වැන්න. කාමී පුරුෂයන් බඳනා පිණිස මරහු විසින් මවන ලද තද මලක් වැන්න. වැලහින්නන් වසන ගුහාවක් වැන්න. මරහු වසන ලෙන දොරක් වැන්න. ස්වර්ණතිලකා නුවණින් සලකා කුසල් කොට ගත නොහී අත්, මලසුන් නොසෝදා මල්පුදා දුෂ්ට ප්‍රාර්ථනාවක් කොට රූපත්ව ඉපිද පවා ප්‍රිය මනාප අවස්ථාවෙහි මෙබඳු මරණයකට පැමිණියාය. නුවණ ඇතිව කුසල් කරන පින්වත, ඔබද නිවන්සිරි පතාම කුසල් කරන්න.[14]

## මූලාශ්‍රයන්ට වඩා නාට්‍ය පිටපතෙහි සිදු කොට ඇති වෙනස්කම්.

සරත්චන්ද්‍රයන් විසින් පෙමතො ජායතී සොකො නාට්‍යය ප්‍රේක්ෂකයා වෙත ප්‍රදානය කිරීමේදී පාලි රසවාහිනී ග්‍රන්ථය හෝ සිංහල සද්ධර්මාලංකාරය ග්‍රන්ථයේ එන කථා සිද්ධිය එලෙසින්ම වචනයක් පාසා හෝ කොටසක හෝ පරිවර්තනයක් ලෙසින් අනුගමනය නොකළේය. මූලාශ්‍රයන්ගෙන් ප්‍රකාශවෙන කථාවස්තුව ද එලෙසම වාර්තා නොකළේය. එහෙත් එහි සඳහන් අරමුණු අභිමතාර්ථවලට හානියක් නොවන පරිදි කථාවේ යම් යම් වෙනස්කම් සිදු කොට ඇත. පාලි ධම්මපදයෙන් යොදා ගෙන ඇති ගාථා අවස්ථාවෝචිතව එලෙසින්ම යොදා ගත්තේය.

ආශ්‍රිත ග්‍රන්ථවල මුඛ්‍යාර්ථවලට හානියක් නොවන සේ විශ්වසනීය ගුණය ආරක්‍ෂා කිරීමට කතුවරයා ප්‍රයත්න දරා ඇති අයුරු පෙනේ.

සද්ධර්මාලංකාර මූලාශ්‍ර කථාවේ මාතෘකාව වශයෙන් සඳහන් වන්නේ ස්වර්ණතිලකා වස්තුව වශයෙනි. නාට්‍යයේ මාතෘකාව ලෙස යොදා ගෙන ඇත්තේ ධම්මපදයේද සඳහන් වෙන

''පෙමතො ජායතී සොකො'' යන ගාථාපාඨ මූලයයි. සැබැවින්ම එය නාට්‍ය මාතෘකාවකට උචිත බවක් පෙන්නුම් කරයි. සද්ධර්මාලංකාරයේ එන කථාව තරමක් දීර්ඝය. දෘශ්‍යකාව්‍යයේ කථාව ජවනිකා තුනකට සීමාකොට ඇත. නාට්‍ය දර්ශනය කරන කාල රාමුව ද පැය තුනකට වඩා අඩුය. පාලි රසවාහිනීයේ මෙන්ම සද්ධර්මාලංකාරයේද ආත්මභාව දෙකක් පිළිබඳව සඳහන් වෙයි. නාට්‍යයේ සඳහන් වන්නේ එක් ආත්ම භාවයකදී සිදු කරන ක්‍රියාවේ ප්‍රතිඵල වශයෙන් ලබන අත්බැව් පිළිබඳව පමණි. මූලාශ්‍ර කෘති දෙකෙහිම අනුරාධපුර අභයුත්තර හෙවත් අභයගිරි චෛත්‍යයට මවක් හා දියණියක් මල්පුදට ගොස් එතැනින් සිදු වූ සිද්ධියක් මවා ඊළඟ ආත්මභාවයේ දියණිය ලැබූ උපත හා සම්බන්ධ සිදුවීම් සඳහන් වෙයි. නාට්‍යයේ සූත්‍රධාර හා ගායකයන් විසින් කථාව ආරම්භයේ හඳුන්වාදීමෙන් අනතුරුව මුලින්ම වේදිකාවට පිවිසෙන්නේ උද්දාල පණ්ඩිතයාය. මූලාශ්‍රවල ගුරුතුමාට සිදුවූ විපත්තියක් පිළිබඳව ආරම්භයේදී සඳහන් නොවේ. එහෙත් වේදිකාවට ප්‍රථමයෙන් පිවිසෙන උද්දාල තමන්ට සිදු වූ විපත කියාපායි.[15] මූලාශ්‍රයන්හි උත්තරමධුරානුවර ස්වර්ණතිලකාව චණ්ඩාල කුලයේ ඉපිද තරුණ වියට පැමුණුණු විට එම ප්‍රදේශයේ ම ධනවත් චණ්ඩාල පුත්‍රයෙකු ඇයට සරණ බන්ධන යෝජනාවක් කිරීම, එය ඈ විසින් ප්‍රතික්ෂේප කිරීම, එවිට චණ්ඩාල පුත්‍රයා එරට රජුට පැමිණිලි කිරීම. අනතුරුව ස්වර්ණතිලකාගේ පියාව රජමැදුරට ගෙන්වා පඤ්චාලනුවරට යාම සඳහා දුවත් සමග පිටත් කර හැරීම. මගදී හමුවන ප්‍රාදේශීය රජවරුන් පස්දෙනෙකුම කුල ප්‍රශ්නය නිසා සිය කඩුවලින් තම ගෙළ සිඳගෙන මිය යාම වැනි කරුණු ප්‍රකාශ වෙයි.[16]

නාට්‍යයේ එම සිද්ධීන් සඳහන් නොවන අතර සූත්‍රධාර විසින් උත්තර මධුරා නුවර ගඳඹ බමුණෙකුට ස්වර්ණතිලකා සිටි බවත්, ගායකයන් විසින් ස්වර්ණතිලකාගේ අලංකාර ශරීර ස්වභාවය ප්‍රකාශ කරනවිට සැඩොල් බමුණා සිය දියණිය වන ස්වර්ණතිලකා සමග වේදිකාවේ ඇති ශිල්පශාස්ත්‍ර ශාලාවට ඇතුළු වෙන බවත් ප්‍රකාශ වෙයි.[17] මූලාශ්‍රයන්හි පියා හා දියණිය පඤ්චමධුරා නුවර පිහිටි රාජසභාවට පිවිසෙති. නාට්‍යයේ එම



දෙපළම පිවිසෙන්නේ රාජසභාවට නොව ශාස්ත්‍ර ශාලාවටය. එය තහවුරු කරන සැඩොල් බමුණා නාට්‍ය වේදිකාවේ මෙසේ කියයි.

''පින්වත් ඇදුරු සඳ, සෙත් වේවා ඔබට
පීඩාවක් කිසිදු කරනට නොසිතු වෙමු
ගදඹෙක් වෙමි, මෙකත දියණියවේ ම-පිය,
යන්නෙමු තනතුරක් සොයා රජ වාසලෙ
පංච මධුරාපුර රජිඳාගෙ සේවයෙ.''[18]

රසවාහිනි කෘතියේ හා සද්ධර්මාලංකාර ග්‍රන්ථයේ ස්වර්ණතිලකා ප්‍රාර්ථනා කරන්නේත් සොයා යන්නේත් තමාට වඩා ඉහළ කුලයෙක ස්වාමියෙකි. එහෙත් පෙමතො ජායතී සොකොහි ස්වර්ණතිලකාගේ දේහ ලක්ෂණ ආදිය බලා උද්දාල මෙසේ කියයි.

''පාලු කතරකි මා හද
නැත එහි සෙවනක්
සිහිලස ගෙන දෙන දිය සීරාවක්
නැත එහි හට ගන්නේ
එකලාව සැරි සරමි
ශූන්‍යතාවෙන් වෙලී
මගේ ම හදවත් කතරේ.
එවිට ඒ ඇසූ ස්වර්ණතිලකා මෙසේ කියයි
''මාණවකයෝ සෙනේ ඇතියෝ
ඔබතුමාගේ හිත පතන්නෝ
බැති සිතින් ඔබ හට පුදන්නෝ
සියලු සැප දුක් ගැන බලන්නේ
කලණ මිතුරෝ නොවෙත්දෝ ඔහු?
හුදකලා වියහැක්කේ කෙලෙසද?''[19]

මූලාශ්‍රයන්හි ශිෂ්‍යයන් 500ක් පිළිබඳව කියැවෙයි. නම් සඳහන් නොවේ. එහෙත් නාට්‍යයේ සඳහන් වන්නේ ඊට වඩා අඩුසංඛ්‍යාවකි. එයින් අග්නිදත්ත, පිංගල, දප්පුල වැනි සිසුන් ප්‍රධාන වෙයි.[20] මූලාශ්‍රවල ස්වර්ණතිලකාව උද්දාලට ගෙනවුත් දෙන ලෙස ඔහුගේ නිවසේදී ස්වකීය මිතුරන්ට කියාපායි. එහෙත්

නාට්‍යයේ ඇගේ අවශ්‍යතාව සිසුනට කියන අතර මිතුරන් අතර පණිවිඩ නොයවයි. නාට්‍යයේ පියා හා දියණිය උද්දාල හමුවී රැකියාවක් සොයා ආ බව සඳහන් කරති. එම අවස්ථාවේ අමුතුම වෙනසක් කතුවරයා විසින් සිදු කොට ඇත. නාට්‍යයට බලපෑ කෘතිවල සරණබන්ධනයට ඇතුළු වීමේ බලවත් ආශාව, කැමැත්ත දිස්වන්නේ ස්වර්ණතිලකා තුළය. එය එසේ වුවද නාට්‍යයේ ස්වර්ණතිලකාව සරණපාවා ගැනීමට දැඩි මහන්සියක් ඕනෑකමක් ගනු ලබන්නේ උද්දාල බමුණා විසිනි. ස්වර්ණතිලකා ඉදිරියේ උද්දාල මෙසේ කියයි.

"මැණික නම් මැණික වේ
කිලුටු පස් යට තිබී ලැබුණ මුත්
මැණික නම් මැණික වේ
අගයදත් නැණැතියෝ නොමහරිති කිසිලෙද"

එවිට ස්වර්ණතිලකා මෙසේ කියයි.
"නොවෙමි සම ඔබ බිරිඳ තනතුරට
ඇදුරිඳුනි ! මම සැඩොල් දුවක් වෙමි
හීන කුලයේ උපන්."21

රසවාහිනී සද්ධර්මාලංකාර යන කෘතිවල ස්වර්ණතිලකාව මැරීමට එන ඇතා ඇයට වශී වී ඈ කුඹ මත තබාගෙන ගෞරවාදර දක්වයි. ඊට පසු දින නපුරු මිනිසුන් යවා ස්වර්ණතිලකාව මරා දමවයි. නාට්‍යයේ මත් වූ නපුරු ඇතා වීථිය දිගේ ඉදිරියට එමින් අනෙක් අයද විනාශ කරමින් ස්වර්ණතිලකාවද ආදරයෙන් තොරව මරා දමයි. මූලාශ්‍රවල උද්දාල වේදනාවට පත් වී ස්වර්ණතිලකා ගැන ශෝකවී ගින්නට පැන සියදිවි හානි කර ගනියි. නාට්‍යයේ ශිෂ්‍යයන් විසින් පච්කිළියක් වන ඇය ඔබතුමාට බේරා ගන්නා අටියෙන් මැරවූයෙමු අපි ඒ ළඳ වශයෙන් ප්‍රකාශ කරනු ලබන අතර උද්දාල එවිට ඇගේ මරණය ඔබ අතින් සිදු නොවූ බවත් මා අතින්ම ඈ මැරුම් කෑ බවත් ප්‍රකාශ කරයි.



25 MAY 2022

"එසේ වේනම් ස්වර්ණතිලකා
මැරුම් කැවේ මා අතින්මයි
මගේ පණ හා සරිව ඉන්නා
සිසුන්ගෙන් නම් මැරුම් කැවේ
ස්වර්ණතිලකා ළඳුනි ඔබ
කුරිරු මරුගේ මුවෙහි හෙළුවෙමි."22

මූලාශ්‍රවල ස්වර්ණතිලකා දෙස බලා ඇත්තේ වැරදිකාරියකගේ පාර්ශ්වයෙන් බැව් නොපෙනේද? මූලාශ්‍රය කෘතිවල ස්වර්ණතිලකා වඩාත් දෝෂ සහගත තැනැත්තියක ලෙස සලකා ඇති බවට ඉඟි ලැබේ. එසේ වුවත් මහාචාර්ය සරත්චන්ද්‍ර මහතා නාට්‍ය නිර්මාණයේදී අන්තවාදී නොවී මධ්‍යස්ථ ලෙස චරිත සාධාරණී කරණයට ලක් කොට ඇත. සරත්චන්ද්‍ර මහතා නාට්‍යයේ එන සෑම චරිතයක් කෙරෙහිම පාහේ මධ්‍යස්ථ දෘෂ්ටියක් හෙළා ඇති බැව් පෙනේ. එසේම සෑම චරිතයකට ම සාධාරණයක් ද ඉටු කර ඇත. ධම්ම පදයෙන්ද කියවෙන පරිදි ආරම්භයේදී දැක්වෙන,

පෙමතො ජායතී සොකො......
තණ්හාය ජායතී සොකො......

වැනි ගාථාවල මුඛ්‍යාර්ථයට ප්‍රධානස්ථානයක් ලබා දීම යුක්ති යුක්ත නොවේද?

## ආන්තික සටහන්

1. ධර්මකීර්ති, රංජිත් (1996), 'නාට්‍ය ප්‍රවේශය, විමර්ශනාත්මක අධ්‍යයනයක්', කොළඹ: ගොඩගේ. පි. 95
2. ජයසුමන, එච්. ජී. (1963), 'නූතන සිංහල නාට්‍ය විචාරය සහ මූලධර්ම' කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ, පි. 42-43
3. මාරසිංහ, වෝල්ටර් (2016) "සංස්කෘත නාට්‍යය හා රංග ශිල්පය", කොළඹ: ගොඩගේ, පි. 06
4. "භාරතීය රංගන කලාව හා භරතමුනි", (2000), සංස්: හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: ගොඩගේ, පි. 116
5. "භාරතමුනි ප්‍රණීත නාට්‍ය ශාස්ත්‍ර, ප්‍රථම භාගය, (2004), පරිවර්තක, වෝල්ටර් මාරසිංහ, කොළඹ: ගොඩගේ, පි. 14

6. නූතන සිංහල නාට්‍ය විචාරය හා මූලධර්ම, පි. 42
7. 'නාට්‍ය ප්‍රවේශය' පි. 25
8. 'සිංහලේ චරිත සියයක්' iv කොටස, (2000) සම්පාදක පී.එච්. ඩයස්, කොළඹ: ගොඩගේ, පි. 1-6
9. 'රසවාහිනී' (1961), සංස්: කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ: ගුණසේන, පි. 74-78
10. 'සද්ධර්මාලංකාරය' (2000), සංස්: ප්‍රාචීන භාෂෝපකාර සමාගම, කොළඹ: සමයවර්ධන පොත්හල, පි. xviii-xix.
11. එම, පි. 345
12. එම, පි. 347
13. එම, පි. 349
14. එම, පි. 344-353
15. සරත්චන්ද්‍ර එදිරිවීර. (1997), 'පෙමතො ජායතී සොකො' 04 වෙනි මුද්‍රණය, කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ, පි. 08
16. 'සද්ධර්මාලංකාරය' පි. 348
17. 'පෙමතො ජායතී සොකො' පි. 12
18. එම, පි. 15
19. එම, පි. 22-23
20. එම, පි. 09
21. එම, පි. 19
22. එම, පි. 43